Sri Lanka national emblem

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1762/34 - 2012 ජූනි 14 වැනි බ්‍රහස්පතින්දා - 2012.06.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/14/08/2006.

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2007.06.04 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කෝන්ගහවෙල, අඹන හන්දිය හි අයි. ජී. විමලසේකර මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 08, කාසල් වීදිය, ඩව් හවුස්, අංක 34/1, ප්‍රධාන කාර්යාලය හි පිහිටි සීක්වාට්ස් එම්. බී. අයි. (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික අරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2012.04.25 වැනි දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
*වැඩබලන කම්කරු කොමසාරිස්.*

2012 මැයි මස 31 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

අයි. ජී. විමලසේකර,
අඹන පෙදෙස,
කෝන්ගහවෙල.

.............................. ඉල්ලුම්කරු.

නඩු අංකය : ඒ 3213

එදිරිව

සීක්වාට්ස් එම්. බී. අයි. ප්‍රයිවට් ලිමිටඩ්,
ප්‍රධාන කාර්යාලය,
ඩව් හවුස්, අංක 34/1,
කාසල් වීදිය,
කොළඹ 08.

.............................. වගඋත්තරකරු.

ප්‍රදානය

කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍ය ගරු ආතාවුද සෙනෙවිරත්න මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 සංශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන්, ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඔහුගේ 2007.06.04 නියෝගයෙන් මා පත් කර ඇත.

02. ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ-

"අයි. ජී. විමලසේකර මහතා කෝන්ගහවෙල කුඹියන්ගහඇල පිහිටි සීමාසහිත සීක්වාට්ස් එම්. බී. අයි. (පුද්ගලික) සමාගමේ කර්මාන්ත ශාලාවේ කම්කරුවකු වශයෙන් සේවය කරමින් සිටිය දී 2003.03.21 සේවා ස්ථානයේ සිදු වූ අනතුරකින් පසුව පූර්ණ ආබාධිත තත්වයට පත්වීම හේතුවෙන් එම සමාගමේ පාලක පක්ෂය වෙතින් යම් සහනයක් ලබා ගැනීමට හිමිකම් ලබන්නේ ද යන්න හා එසේ

හිමිකම් ලබන්නේ නම් එම සහනයන් මොනවාද යන්න පිළිබඳව ද වේ.”

03. පාර්ශ්වයන් විසින් කාර්මික ආරවුල් පනතේ රෙගුලාසි යටතේ ප්‍රකාශ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව වගඋත්තරකාර පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද විරෝධතා දෙක 2008.04.01 දින නිශ්ප්‍රභා කිරීමෙන් පසු පරීක්ෂණය 2008.05.07 දින ආරම්භ කෙරිණි. ඉල්ලුම්කාර පාර්ශ්වයේ නියෝජිත එස්. එම්. ආර්. බණ්ඩාර මහතාගේ ඉල්ලීම පරිදි ප්‍රථමයෙන් සාක්ෂි මෙහෙයවීම එම පාර්ශ්වයට පවරන ලදී. 2008.05.07 ඉල්ලුම්කරු සාක්ෂි දීම ආරම්භ කරන ලදී. 2009.03.24 වැනි දින එම සාක්ෂිය අවසන් කර ඇත්තේ අවුරුද්දකට ආසන්න කාලයක් ගත වීමෙන් පසුව ය. නොයෙකුත් හේතූන් දක්වමින් දෙපාර්ශවයම කල් ලබා ගන්නා ලද අතර බේරුම්කරණය කිප වතාවක්ම සාක්ෂි මෙහෙයවීමේ දී දීර්ඝ ලෙස කල් ගත කිරීම අසාධාරණ බව පෙන්වා දී ඇතත් ඉන් පලක් නොවීය. එමෙන්ම එකම කරුණක් පිළිබඳව නැවත නැවත ප්‍රශ්න කිරීම තුළින් පරීක්ෂණය නීරස තත්ත්වයකට වැටුන ද පැමිණිල්ලේ නියෝජිතයාට එය ප්‍රශ්ණයක් නොවන බැව් පෙනෙන්නට තිබුණි.

04. පැමිණිල්ලේ දෙවන සාක්ෂිකරු ප්‍රධාන කාර්යාලයේ කම්කරු නිලධාරි පල්ලියමුල්ලේ ලේකම්රාලලාගේ සුදර්ශි ලේකම්ගේ මහත්මියගේ සාක්ෂිය 2009.04.27 වැනි දින ආරම්භ කොට 2009.08.25 වැනි දින අවසන් කරන ලදී. මෙම සාක්ෂිකාරිය ඇය සතුව තිබුණ ලිපි ලේඛණ අනුකූලව සාක්ෂි දී ඇති බැවින් එම සාක්ෂිය අවසන් කිරීමට මාස 04ක් පමණ කල් ගත විය. එම සාක්ෂිය අවසන් කිරීමෙන් පසුව පැමිණිල්ලේ සාක්ෂි අවසන් කරන ලදී.

05. මෙම පරීක්ෂණය පැමිණිල්ලේ ඇති දුර්වලතා සහ බේරුම්කරණ යොමුවේ ඇති යම් යම් දුර්වලතා නිසා පරීක්ෂණය අනවශ්‍ය ලෙස දික්ගැස්සීම වැලැක්වීම සඳහා ඉල්ලුම්කරුට සාධාරණ ගෙවීමකින් සමථයකට පත් කිරීම ගැන සලකා බලන ලෙස අවස්ථා දෙකකදී මා විසින් පාර්ශවයන්ට යෝජනා කරන ලදී. 2010.05.26 වැනි දින පරීක්ෂණ සටහන්වල (369-3/0) අනුව රු. 2,50,000 වන්දි මුදලක් ගෙවා පරීක්ෂණය බේරුම් කිරීමට වගඋත්තරකාර සමාගම එකඟත්වය පළ කළ බවත් ඉල්ලුම්කාර පාර්ශ්වය ඊට එකඟ නොවූ බැවින් පරීක්ෂණය අවසානය තෙක් පැවැත්වීමට ම විසින් තීරණය කරන ලදී. (2010.05.21 දින පිටු අංක 01 සහ 02)

06. මේ අනුව වගඋත්තරකාර පාර්ශ්වයේ සාක්ෂි මෙහෙයවීම 2009.12.09 වැනි දින ආරම්භ කරන ලදුව එදින සමාගමේ මුල්‍ය පාලන කළමණාකාර ජෙස්ටින් ජයන්ත මැදගම මහතා අවුරුදු දෙකකට පසුව 2011.11.01 වැනි දින එම සාක්ෂිය අවසන් කරන ලදී.

07. *කම්කරු වන්දි කොමසාරිස්ගෙන් වන්දි ලබා ගැනීමේ නඩුව :*

ඉල්ලුම්කරු මෙම බේරුම්කරණය වෙත පැමිණ ඇත්තේ මහනුවර වන්දි සංචාරක උසාවියේ ඔහු විසින් පවරණ ලද අංක සී/383/2003/සී නඩුව අවසන් වීමත් සමග ය. වන්දි කොමසාරිස් ඉදිරියේ ඒ - 3, ඒ - 4, ඒ - 5, සහ ඒ - 6 වෛද්‍ය වාර්තා ඉදිරිපත් කිරීමෙන් ඔහුට 2003.03.21 වැනි දින ඔහුට වගඋත්තරකාර සමාගමේ සේවයේ යෙදී සිටියදී සිදු වූ අනතුරක් හේතුකොටගෙන 65%ක හානියක් සිදු වී ඇති බැවින් ඊට සමාන වන්දියක් ලබා ගැනීමට උත්සාහයක් දරා ඇත. (ඒ - 35) එහෙත් ඊට පෙර ඉහත සඳහන් වන්දි කොමසාරිස් නඩුවේ R-15 දරන 2005.08.05 දිනැති නියෝගයෙන් ඉල්ලුම්කරුට රු. 31,440ක මුදලක් වන්දි වශයෙන් ගෙවීමට නියම කොට වැඩට නොපැමිණි කාලය සඳහා රු. 20,570ක් ගෙවා ඇති බැවින් එම මුදල අඩු කොට ඔහුට ගෙවිය යුතු වන්දි මුදල රු. 10,870ක් බවට නිගමනය කර ඇත.

08. එහෙත් ආර් 16 දරන වන්දි කොමසාරිස්ගේ අතුරු නියෝගය අනුව ඉල්ලුම්කරු බේරුම්කරණයට ඉදිරිපත් කර ඇති යොමුව අනුව නැවත රැකියාව ලබා ගැනීම සඳහා ඉල්ලා ඇති බැවින් ඔහුට 65%ක හානියන් සිදු වී ඇතැයි වන්දි අධිකරණයෙන් ඉල්ලා සිටීම ප්‍රතිවිරෝධි තත්වයක් බැවින් ඉල්ලුම්කරුගේ ඉල්ලීම වන්දි කොමසාරිස් විසින් නිශ්ප්‍රභා කරන ලදී. ඉල්ලුම්කරු ඉහළ අධිකරණයක් ඉදිරියේ එම තීන්දු අභියෝගයට ලක් කර ඇත.

09. *බේරුම්කරණ නඩුව :*

ඉල්ලුම්කරුගේ නියෝජිත සාධාරණ වැටහීමකින් තොරව, බේරුම්කරණ නඩුවට ද ගොනු කර ඇත්තේ ඉහත සඳහන් වන්දි කොමසාරිස් නඩුවට ඉදිරිපත් කරන ලද ලිපි ලේඛණ වේ. මෙම ලිපි ලේඛණ අතර ඒ-3, ඒ-4, ඒ-5 සහ ඒ-6 ඉන් ප්‍රධාන ලේඛන ලෙස සැලකේ. මෙම ලේඛණ අනුව ඉල්ලුම්කරුට සිදු වී ඇති ආබාධයේ ප්‍රතිශතය 65%කි. ඉල්ලුම්කරු වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ලිඛිත දේශන ගොනුවේ 36 වැනි පිටුවෙන් ද මෙම තත්ත්වය තහවුරු වේ. වන්දි කොමසාරිස්වරයා ඉදිරිපත් කරන ලද මෙම ලිපි ලේඛණ ඒ ආකාරයෙන්ම බේරුම්කරණ නඩුවට ඉදිරිපත් කිරීම ගැන ඉල්ලුම්කරුට හෝ ඔහුගේ නියෝජිතයාට වැටහීමක් නොතිබුණු බව පෙනේ. වටහා ගැනීමට උත්සාහයක් ද දරා නැත. මෙම බේරුම්කරණ නඩුව වගඋත්තරකාර සමාගමේ එකඟත්වයෙන් සමථයකට පත් කොට ඉල්ලුම්කරුට සාධාරණ වන්දියක් ලබාදීමට මා වෑයම් කලේ ඒ නිසා ය. (මෙම ප්‍රදානයේ 05 ඡේදයේ බලනු මැනවි).

අනතුර සිදු වී මාස 03කට පසුව එනම් නිර්දේශිත නිවාඩු අවසානයේ දී ඉල්ලුම්කරුට සිදු වී ඇති ආබාධය සම්බන්ධයෙන් ඒ-3, ඒ-4, ඒ-5 සහ ඒ-6 වෛද්‍ය වාර්තා වන්දි කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කර ඇත. එම ලේඛණ බේරුම්කරණයට ද ඉදිරිපත් කර ඇත.

10. මාතලේ වෛද්‍ය එස්. ටී. විජේසුරේන්ද්‍ර මහතා විසින් වගඋත්තරකාර සමාගමේ කළමණාකරු වෙත යවන ලද 2003.07.29 දිනැති R4 ලිපියේ ඉල්ලුම්කරු අයි. ජී. විමලසේකර සම්බන්ධයෙන් මෙසේ සඳහන් කර ඇත.

“I. G. Wimalasekera - in reply to your letter dated 22nd july regarding fitness of the above-named he is now fit for light work as a peon or watchman, but he will be unable to resume heavy manual labour for another two (2) months”.

මුරකරුවකු හෝ පියන් කෙනෙකු වශයෙන් ඉල්ලුම්කරුට සේවය කළ හැකි බව ආර් 4 ලිපියේ සඳහන් වී ඇතත් ඉල්ලුම්කරු එසේ වැඩ භාර ගැනීමට නොපැමිණි බැවින් වගඋත්තරකාර සමාගම 2003.08.15 දිනැති ලිපිය (ආර්-05) ඔහුට යවා ඇත. එම ලිපියේ අවසාන ඡේද දෙකේ මෙසේ සඳහන් වේ.

11. "It is 15 days since you were instructed to come for work, but you have chosen to ignore our request. We have neither received any communication from you since then.

We assume that you are not interested in your work anymore and therefore, treat you as one who has vacated his position you shall not be paid any wage from 01.08.2003" (R 5)

12. 2008.09.09 වැනි දින වගඋත්තරකාර පාර්ශවයේ නීතිඥ ඉල්ලුම්කරුගේ ආර්-06 ලිපිය ඉදිරිපත් කරමින් අසන ලද හරස් ප්‍රශ්නයකට ඉල්ලුම්කරු මෙසේ පිළිතුරු දී ඇත (පරීක්ෂ සටහන් 13 පිටුව)

ප්‍ර. : තමන්ට තවදුරටත් යෝජනා කරනවා තමන්ට සේවයට එන්න කිසිම චේතනාවක් තිබුණේ නැහැ කියා ?

උ. : මට උවමනාවක් තිබුණා

ප්‍ර. : තමාට උවමනාවක් තිබුණත් ආර්-06 ලේඛනයෙන් සේවයට වාර්තා කිරීමට නොහැකි බව ආයතනයට දන්වා තිබෙන බව මා යෝජනා කරනවා. එය පිළිගන්නවාද ?

උ. : එහෙම ලියා තිබෙනවා (ආයතනයේ සේවයට වාර්තා කිරීමට නොහැකි බව ආර් 6 ලිපියෙන් සමාගමට දන්වා ඇත)

මෙම ලිපිය හේතුකොට ගෙන බේරුම්කරණයෙන් සහනයක් ලබා ගැනීමට ඉල්ලුම්කරුට හැකියාවක් නැත.

13. ඉල්ලුම්කරු වගඋත්තරකරුගේ නීතිඥවරයාගේ හරස් ප්‍රශ්න වලට පිළිතුරු දුන් විලාශය, ඔහුගේ නියෝජිත සමග සාකච්ඡා කිරීමේ ස්වභාව, සමස්ථයක් වශයෙන් හරස් ප්‍රශ්නවලට පිළිතුරු දීමේ දී ඔහුගේ හැසිරීම් රටාව මාගේ නිරීක්ෂණයට ලක් විය.

වගඋත්තරකාර සමාගම ඉල්ලුම්කරුට සැහැල්ලු වැඩ ලබා දීමට ඔහු පැමිණෙතැයි බලාපොරොත්තුවෙන් සිටි මුත් ඔහු කිසිම අවස්ථාවක සැහැල්ලු වැඩ භාර ගැනීමට උනන්දුවක් දක්වා නැත.

"සැහැල්ලු වැඩ " ගැන කිසිම අවස්ථාවක වචනයක්වත් කථා කර නැත. වගඋත්තරකාර ආයතනයේ යළි සේවය කිරීමට අවංක වුවමනාවක් නොතිබුණි බව ආර්-04, ආර්-05, ආර්-06, ආර්-08, ආර්-9 සහ ආර්-11 යන ලේඛනවලින් මොනවට පැහැදිලිය.

2003.03.21 වැනි දින සේවා ස්ථානයේ දී සිදු වූ අනතුරෙන් පසුව ඔහු පූර්ණ ආබාධිත තත්වයට පත්ව නැත. ඉල්ලුම්කරු විසින්ම ගොනු කරන ලද ඒ-3, ඒ-4 සහ ඒ-5 වෛද්‍ය වාර්තාවලින් මේ බව තහවුරු වේ. මෙම ලේඛන අනුව ආබාධයේ ප්‍රතිශතය 65% මේ අනුව වගඋත්තරකාර සමාගම යටතේ සේවය කිරීමට එම සමාගම විසින් ඉල්ලුම්කරුට සැපයීමට එකඟ වූ සේවා පහසුකම් ලබා ගැනීමට ඉල්ලුම්කරු අපොහොසත් වී ඇති බැවින් බේරුම්කරන ගොනුවේ සඳහන් සහනය ලබා ගැනීමට ද ඔහුට හැකියාවක් නැත.

14. ඉල්ලුම්කරුට වගඋත්තරකාර පාර්ශවය විසින් යවන ලද අවසාන වැදගත් ලිපිය වගඋත්තරකාර පාර්ශවය විසින් ආර් 12 වශයෙන් සලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර ඇත. 2004.01.19 දිනැති මෙම ලිපියේ පළමු වැනි ඡේදයේ මෙසේ සඳහන් වේ.

"අපගේ 2003.11.28 වැනි දින දරන ලිපියෙන් ඔබට නැවත සේවය ලබා දීම ගැන සාකච්ඡා කිරීම සඳහා 2003.12.15 වැනි දිනට පෙර මෙම කාර්යාලයට පැමිණෙන ලෙස දන්වා සිටිමු. සති දෙකකට අධික කාලයක් ලබා දී තිබුණ ද ඔබ 2003.12.13 වැනි දින (සෙනසුරාදා) කාර්යාලයට පැමිණ නැත. එදින මා නිවාඩු බැවින් ඊළඟ සතියේ සඳුදා හෝ වෙනත් දවසක පැමිණෙන ලෙස කාර්යාලයේ ලිපිකරු මහත්මියක් ඔබට දන්වා ඇත. එහෙත් මේතාක් (2004.01.19) වන තුරු ඔබ පැමිණ නැත. ලිපියකින් හෝ නොපැමිණීමට හේතු දන්වා නැත."

මේ අනුව ඉල්ලුම්කරුට අවස්ථා කිහිපයක් වගඋත්තරකාර සමාගම විසින් ලබා දී ඇතත් ඉල්ලුම්කරු ඊට එකඟත්වක් ලබා දී නැත. එවන් අවස්ථා සියල්ලම ඉල්ලුම්කරු මඟ හැර ඇති බැව් පෙනේ. මේ තත්ත්වය යටතේ බේරුම්කාර යොමුවේ සඳහන් සහනයන් ලබා ගැනීමට ඔහුට හැකියාවක් නැත.

15. ඉල්ලුම්කරු 2008.06.24 වැනි දින දෙන ලද සාක්ෂියේ 08 වැනි පිටුවේ වගඋත්තරකාර පාර්ශවයේ නීතිඥ තැනගේ හරස් ප්‍රශ්න වලට මෙසේ පිළිතුරු දී ඇත.

ප්‍ර. : තමන් කී වතාවක් ගොස් සේවය ඉල්ලා සිටියා ද ?

උ. : මම හතරවතාවක් පමණ ගොස් ඉල්ලා තිබෙනවා. ඊට අමතරව මම ලිඛිතව දන්වාත් තිබෙනවා.

ප්‍ර. : ඒ අවස්ථාවේ දී වගඋත්තරකාර ආයතනය තමන්ට ප්‍රකාශ කළේ කුමක් ද ?

උ. : තමුසේ යනවා යන්න. මම දන්නේ නැහැ. තමුසේ අයින් කරලා ඉන්නේ. තමුසෙගෙන් අපිට වැඩක් නැහැ කියා මාව එළව ගත්තා.

ඉල්ලුම්කරුගේ මෙම කියමන ලිඛිතව හෝ වෙනත් වාචික සාක්ෂියකින් තහවුරු කිරීමට ඔහු අසමත් වී ඇත.

සියලු කාරණා සැලකිල්ලට ගැනීමේ දී පැහැදිලි වන්නේ ඉල්ලුම්කරුට මෙම ආයතනයේ නැවත සේවය කිරීමට එම ආයතනය ඔහුට ලබා දුන් සියලු අවස්ථා ඔහු විසින් පැහැර හැර ඇති බවයි.

16. කරුණු මෙසේ හෙයින් බේරුම්කාර යොමුවේ සඳහන් වන පරිදි සමාගමේ කර්මාන්ත ශාලාවේ කම්කරුවෙකු වශයෙන් සේවය කරමින් සිටියදී 2003.03.21 වැනි දින සේවා ස්ථානයේ දී සිදු වූ ආබාධිත තත්ත්වයට පත්වීම සම්බන්ධයෙන් වන්දි කොමසාරිස් ඉදිරියේ දී පවරන ලද අංක සී 30/383/2003සී නඩුවෙන් ඉල්ලුම්කරුට

ගෙවීමට නියම කරන ලද (ඒ-15 සහ ඒ-16 දැක්වෙන) වන්දි මුදල සම්බන්ධයෙන් අවශ්‍ය නම් නීති උපදෙස් මත ක්‍රියා කිරීම ඔහු සතු කාර්යයකි.

වගඋත්තරකාර සමාගම විසින් ඉල්ලුම්කරුට ලබාදීමට යෝජිත සහනය ලබා ගැනීමට ඉල්ලුම්කරු උනන්දුවක් දක්වා නැති බැවින් ඔහුට යම්කිසි සහනයක් ලබා දීමට බේරුම්කරණයට හැකියාවක් නැත. එබැවින් මේ යොමුවේ සඳහන් කාරණය සම්බන්ධයෙන් ප්‍රදානයක් නොකිරීමට මා විසින් තීරණය කර ඇත.

ටී. පියසෝම,
බේරුම්කරු.

2012 අප්‍රේල් මස 25 වැනි දින,

06-1036

---

*මගේ අංකය :* CI/1649/2005.

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2008.05.23 දින දරන නියෝගයෙන්, බේරුම්කිරීම මඟින් විසඳීම සඳහා යොමු කරනු ලැබූ පිටකෝට්ටේ, කෝට්ටේ පාර, අංක 416හි ජාතික සේවක සංගමය හා කොළඹ 14, නව කැළණි පාලම පාර, අංක 73/1, ප්‍රධාන කාර්යාලය හි පිහිටි ලංකා පොස්පේට් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් මා වෙත ලබා දෙන ලද අංක ඒ 3245 දරන ප්‍රදානය 2010.11.23 වැනි දිනැති හා අංක 1681/24 දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලදී.

එම ප්‍රදානය සම්බන්ධයෙන් කාර්මික ආරාවුල් පනතේ 34 වගන්තිය යටතේ බේරුම්කරු විසින් මා වෙත ලබා දී ඇති 2012.05.02 වැනි දිනැති අර්ථ නිරූපණය එම පනතේ 18(1) වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
*වැඩබලන කම්කරු කොමසාරිස්.*

2012 මැයි මස 31 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

ජාතික සේවක සංගමය,
අංක 416, කෝට්ටේ පාර,
පිටකෝට්ටේ.

හා

නඩු අංකය : ඒ - 3245

ලංකා පොස්පේට් ලිමිටඩ්,
ප්‍රධාන කාර්යාලය,
අංක 73/1, නව කැළණි පාලම පාර,
කොළඹ 14

අර්ථ නිරූපනය

ඉහත ආරාවුල සම්බන්ධයෙන් 2010.09.29 වැනි දිනැතිව ලබා දී ඇති මාගේ ප්‍රදානය අංක 1681/24 දරන හා 2010.11.23 වැනි දිනැති රජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති අතර ඒ සම්බන්ධයෙන් පාර්ශවකරුවන් විසින් ඉල්ලා සිටින ලද අර්ථ නිරූපනය පහත දැක්වේ.

එම ප්‍රදානයේ මූලික වශයෙන් සේවකයින් 14 දෙනෙකුට අදාළව සමථකරණයකට එළඹීමක් සිදුව ඇති අතර ඒ අනුව 2007.01.01 වැනි දින සිට ඔවුනට හිමි විය යුතු හිඟ අතිකාල දීමනා හා ඉතිරි වාර්ෂික අසනීප නිවාඩු දීමනාවේ හිඟ මුදල් ගෙවීමට සේවා යෝජක ආයතනය විසින් එකඟ වී තිබුණි. එමෙන්ම ආරාවුලට හේතු වී පවත්නා කාරණාවට අදාළ සේවකයින් 19 දෙනෙකු සිටින අතර ඉන් තිදෙනෙකු විශ්‍රාම ගොස් ඇති බව ද එහි තෙවන පිටුවේ සඳහන් වුණි. එම සේවකයින් තිදෙනාගෙන් එක් අයෙකු වන එම්. ඩබ්. ජයසිංහ මහතා විසින් තමා 2007 වර්ෂයේ සේවයේ නියුතුව සිටි බවත් විශ්‍රාම යන ලද්දේ 2008.11.29 වැනි දින බවත් එසේ හෙයින් තමාට ද එම සහන ලබා දීමට කටයුතු කරන ලෙසට 2011.10.21 වැනි දිනැති ලිපිය මගින් ජාතික සේවක සම්මේලනය හරහා ඉල්ලුම්කර ඇති බව දන්වා ඇත. ඒ අනුව මේ පිළිබඳව සලකා බලා එම්. ඩබ්. ජයසිංහ මහතා ඇතුළු විශ්‍රාමික සේවකයින් 3 දෙනා හට ද එම සහන ලබාගත හැකි ද යන්න පිළිබඳව අර්ථ නිරූපණයක් කාර්මික අධිකරණයෙන් ඉල්ලා ඇත.

2012.01.30 වැනි දින මේ සම්බන්ධයෙන් විමසා බැලීමට දෙපාර්ශවයම කැඳවූ අවස්ථාවේ වගඋත්තරකාර ආයතනයෙන් මානව සම්පත් කළමණාකාර-අප්සරා මුණසිංහ මහත්මිය සහ පිරිස් හා පරිපාලන නිලධාරී - ආර්. කේ. මංචනායක මහතා පැමිණ සිටි අතර ඉල්ලුම්කාර පාර්ශවයෙන් කිසිවකු පැමිණ සිටියේ නැත. එම අවස්ථාවේ දී වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි සාමාජිකයින් දන්වා සිටියේ පෙර ප්‍රදානයේ ලබා දී ඇති වරප්‍රසාද ඉහතින් සඳහන් සේවකයින් තිදෙනා සඳහා ද ලබා දීමට විරෝධතාවක් නොමැති බවයි.

මේ අනුව මෙම ඉහත ප්‍රදානයේ ලබා දී ඇති වරප්‍රසාදයන් මෙම සේවකයින් තිදෙනාට ලබාදීම සාධාරණ හා යුක්තිසහගත ලෙස සලකමි.

බේරුම්කරු,
ඩී. ඒ. විජේවර්ධන

2012ක් මැයි මස 02 වැනි දින,

06-1037

*මගේ අංකය :* IR/15/10/2005.

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 3(1)(ඇ) වගන්තිය යටතේ 2006.12.01 වැනි දිනැති හා අංක 1473/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති *විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද, 2006.11.23 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් පන්නිපිටිය, කොට්ටාව, මාලඹේ පාර, අංක 9/1607හි ලෙස්ලි අරඹවෙල මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 10, ටී. බී. ජායා මාවත, අංක 500හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2012.05.14 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
*වැඩබලන කම්කරු කොමසාරිස්.*

2012 මැයි මස 31 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

ලෙස්ලි අරඹවෙල මහතා,
අංක 9/1607, මාලඹේ පාර,
කොට්ටාව,
පන්නිපිටිය.

............................. ඉල්ලුම්කරු.

නඩු අංකය : ඒ - 3194

හා

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක 500, ටී. බී. ජායා මාවත,
කොළඹ 10

............................. වගඋත්තරකරු.

ප්‍රදානය

කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍ය ගරු ආතාවුද සෙනෙවිරත්න මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 සංශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන්, ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඔහුගේ 2006.11.23 නියෝගයෙන් මා පත් කර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ :-

"ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවය කළ ලෙස්ලි අරඹවෙල මහතා වෙත එම අධිකාරිය විසින් නිකුත් කරන ලද 1999.06.08 දිනැති ලිපිය අනුව 1999.03.10 දින ක්‍රියාත්මක වන පරිදි සිය කැමැත්තෙන් තනතුර හැරගියා සේ සැලකීම යුක්ති සහගත ද යන්න හා නොඑසේ නම්, ඔහුට කුමන සහනයක් හිමි ද යන්න පිළිබඳව ද වේ.".

අදාල කාර්මික ආරවුල බේරුම්කිරීම සඳහා 2006.11.02 වැනි දින ප්‍රථම ලිපියෙන් මා වෙත දැනුම් දුන් අතර ඒ අනුව ප්‍රථම වතාවට කාර්මික අධිකරණයේ 2007.09.15 වැනි දින කැඳවන ලදී. මෙහි දී ඉල්ලුම්කාර පාර්ශවය තම අයිතිවාසිකම් වෙනුවෙන් සිය ප්‍රථම විස්තර ප්‍රකාශය ඇ1 සිට ඇ12 දක්වා ලේඛන සමග මා වෙත ඉදිරිපත් කළ අතර වගඋත්තරකාර පාර්ශවය සිය ප්‍රථම ප්‍රකාශය කෙටියෙන් කරුණු දැක්වුව ද පසුව ප්‍රතිඋත්තර ප්‍රකාශය මගින් දීර්ඝ ලෙස කරුණු දක්වමින් 1 සිට 13 දක්වා ඇමුණුම් සමග ඉදිරිපත් කරන ලදී. දෙපාර්ශවයේ අදහස වූයේ දීර්ඝ ලෙස පවත්වන ලද විභාගයකින් අනතුරුව තීන්දුව ලබා ගැනීමේ අවශ්‍යතාවයයි.

ඒ අනුව 2007.10.16 වැනි දින ඉල්ලුම්කාර පාර්ශවයේ වාචික සාක්ෂි ආරම්භකර හරස් ප්‍රශ්න අවසන් වීමෙන් අනතුරුව වගඋත්තරකාර පාර්ශවයේ සාක්ෂි සහ හරස් ප්‍රශ්න අවසන් කර දෙපාර්ශවයේ ලිඛිත දේශන සඳහා අවස්ථාව සලසා දුන් අතර පසුව වගඋත්තරකාර පාර්ශවය සිය ලිඛිත දේශනය R1 සිට R10 දක්වා ලේඛන සමඟ මා වෙත ඉදිරිපත් කළ අතර ඉල්ලුම්කාර පාර්ශවය සිය ලිඛිත දේශනය A1 සිට A21 දක්වා ලේඛන සමග ඉදිරිපත් කරන ලදී.

ඉහත සඳහන් ආකාරයට පාර්ශවකරුවන් කරුණු ගොනු කොට මා වෙත ඉදිරිපත් කළ අතර ඉල්ලුම්කාර පාර්ශවයේ ප්‍රථම ප්‍රකාශය ඒ සමග ඉදිරිපත් කළ ලේඛන සාක්ෂි හා හරස් ප්‍රශ්නවලට ලබා දෙන ලද පිළිතුරු ද ලිඛිත දේශන සමග ඉදිරිපත් කළ ලේඛන පිළිබඳව දීර්ඝ අධ්‍යයනයක් ද වගඋත්තරකාර පාර්ශවය ඉදිරිපත් කළ ප්‍රථම ප්‍රකාශය ප්‍රතිඋත්තර ප්‍රකාශය සමග ලේඛන, වගඋත්තරකාර පාර්ශවයේ මූලික සාක්ෂි සහ හරස් ප්‍රශ්න ද සමග ඉදිරිපත් කළ ලිඛිත දේශනය සහ ලේඛන සඳහා ද මාගේ අවධානය යොමු කරමින් මා පහත නිගමන සඳහා එළඹුණ බව දන්වා සිටිමි.

මෙම නඩුවේ ඉල්ලුම්කරු 1983.12.13 වැනි දින III වැනි ශ්‍රේණියේ ලිපිකරුවෙකු ලෙස එවකට තිබූ මහවැලි ඉංජිනේරු හා නිර්මාණ ඒජන්සියේ සේවයට බැඳී ඇති අතර 1991.05.01 වැනි දින ඔහු ප්‍රවාහන සහකාර තනතුරට පත් කර ඇත. පසුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සියලුම ආයතනවල පොදුවේ එක් බඳවා ගැනීමේ පරිපාටියක් 1990.03.01 වැනි දින සිට මහවැලි අධිකාරියේ ද ක්‍රියාත්මක කරන ලදී. එම බඳවා ගැනීමේ පරිපාටියෙන් ඉල්ලුම්කරු III වැනි ශ්‍රේණියේ ප්‍රවාහන නිලධාරියෙකු ලෙස නිලය සංශෝධනය කරනු ලැබීම නිසා 1990.03.01 දින සිට ඔහු එම තනතුරට උසස් කොට ඇත.

ඉල්ලුම්කරු මෙසේ සේවය කරමින් සිටින විට විදේශ රැකියාවක් සඳහා ඉල්ලුම්කරුට ඇරයුමක් ලැබී ඇත. ඒ අනුව ඉල්ලුම්කරු 1997.02.10 වැනි දින සහකාර අධ්‍යක්ෂ (යාන්ත්‍රික) මගින් මහවැලි අධිකාරියේ පිරිස් පාලන වෙත ඒ සඳහා වැටුප් සහිත නිවාඩු ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. එම ලිපිය ඒ-4 වශයෙන් මේ

අධිකරණයේ සලකුණු කර ඇත. ඒ අනුව ඉල්ලුම්කරු ශ්‍රී ලංකාවෙන් බැහැරව ගත කිරීම සඳහා නිවාඩු ඉල්ලුම් පත්‍රයක 1997.02.10 වැනි දින සිට 1999.03.10 වැනි දින දක්වා තුර්කි ආයතනයේ රැකියාව සඳහා නිවාඩු ඉල්ලුම් පත්‍රයක් මගින් වගඋත්තරකාර ආයතනයෙන් ඉල්ලා ඇත. නිවාඩු ඉල්ලුම් පත්‍රය ඒ-4 සී වශයෙන් ද, විදේශගත වීමට අදහස් වන කාලය ඒ-4ඩී වශයෙන් ද මේ සමග සලකුණු කර ඇත. ඉල්ලුම්කරුගේ ඒ-4 සී ඉල්ලුම්පත්‍රය අනුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ලේකම් ජනරාල් වෙත කළමණාකාර අධ්‍යක්ෂ මහවැලි ඉංජිනේරු හා නිර්මාණ ඒජන්සිය වෙතින් එහි ඉංජිනේරු එච්. ඩී. එස්. ද අල්විස් මහතා විසින් 1997.02.26 වැනි දින ඉල්ලුම්කරුගේ නිවාඩු ඉල්ලීම පිළිබඳව ලේකම් ජනරාල් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කොට ඇත. එම ලිපිය ඒ-5 වශයෙන් ඉංජිනේරු එච්. ජී. අල්විස් මහතාගේ අත්සන ඒ5 ඒ වශයෙනුත් ලේකම් ජනරාල්ගේ නාමය ඒ 5 බී වශයෙන් ද, ඉල්ලුම්කරුගේ වැටුප් රහිත නිවාඩු නිර්දේශ කර ඇති අතර එයට අනුමැතිය ලැබී ඇති කොටස ඒ 5 සී වශයෙනුත් මේ සමග සලකුණු කර ඇත. ඉල්ලුම්කරුගේ ඉල්ලීම අනුව වාරිමාර්ග විදුලි බල අමාත්‍යංශයේ ලේකම් විසින් විදේශ රැකියාව සඳහා වැටුප් රහිත නිවාඩු අනුමත කර ඇති බව 1997.03.07 වැනි දින ඉල්ලුම්කරු වෙත පාලන නිලධාරී විසින් එවා ඇති ලිපිය ඒ 6 වශයෙන් මෙම අධිකරණයේ සලකුණු කර ඇත. ඒ සඳහා මාගේ අවධානය යොමු කළ අතර අදාළ නිවාඩු නීත්‍යානුකූලව ආයතනයේ ක්‍රියා පටිපාටියට අනුකූලව ලබාගත් නිවාඩු බව සාධාරණව ඔප්පු වී ඇත.

ඒ අනුව ඉල්ලුම්කරු විසින් වගඋත්තරකාර අධිකාරියත් සමග අත්සන් කොට ඇති ගිවිසුම් පත්‍රය පිටු 4කින් යුක්ත වේ. එම ගිවිසුම් පත්‍රය අනුව ඉල්ලුම්කරු වැටුප් රහිත නිවාඩු අනුමත කරමින් ඉදිරිපත් කොට ඇති එම ගිවිසුම් පත්‍රය පිටු 4කින් යුක්ත වන අතර එය ඒ 7 වශයෙන් අධිකරණයේ සලකුණු කර ඇත. එම ගිවිසුම් පත්‍රයේ වගඋත්තරකාර අධිකාරිය විසින් සහ ඉල්ලුම්කරු විසින් අත්සන් කරන ලද කොටස් ඒ 7 ඒ සහ ඒ 7 බී වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ඉල්ලුම්කරු විදේශගතව එම තුර්කි ආයතනයේ සේවය කරමින් සිටින විට 1999.02.03 වැනි දින වගඋත්තකාර ආයතනයට ලිපියක් එවමින් වැටුප් රහිත නිවාඩු කාලය නැවත දීර්ඝ කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. එම ලිපිය ඒ 8 වශයෙන් සලකුණු කර ඇති අතර ඉල්ලා සිටින්නේ ඉදිරි මාස 03ක කාල සීමාවට සේවය කිරීමට සිදුව ඇති බැවින් ඒ සඳහා නිවාඩු දීර්ඝ කරන ලෙසය.

ඒ 8 ලිපියට වගඋත්තරකාර අධිකාරිය විසින් 1999.02.19 වැනි දින ඉල්ලුම්කරුට ලිපියක් යවමින් ඔහුගේ ඉල්ලීම ඉටු කිරීමට නොහැකි බවත් වැටුප් රහිත නිවාඩු කාලය අවසන් වූ වහාම නැවත සේවයට වාර්තා නොකළහොත් තනතුර අතහැර ගියා සේ සලකන බවත්, ඉල්ලුම්කරුට දන්වා ඇත. එම ලිපියට ඒ 9 වශයෙන් මෙම අධිකරණයේ සලකුණු කර ඇත. ඒ-9 ලිපියට ඉල්ලුම්කරු විසින් 1999.03.03 වැනි දින ලි. ප. තැපෑලෙන් වගඋත්තරකාර අධිකාරිය වෙත ලිපියක් එවා ඇත. එම ලිපිය ඒ 10 වශයෙන් සලකුණු කර ඇති අතර, වගඋත්තරාකර අධිකාරිය එම ලිපිය ඔවුනට ලැබුණු බව පිළිගෙන ඇත. එම අධිකාරියේ මුද්‍රාව ඒ 10 ලිපියේ සඳහන් වේ. ඉල්ලුම්කරු සේවය කළ සමාගම විසින් ඉල්ලුම්කරුට ඉදිරි මාස 03ක කාලය සඳහා සේවයෙන් මුදා හල නොහැකි බව වගඋත්තරකාර ආයතනයට දන්වා ඇත.

ඉල්ලුම්කරු විදේශගතව සේවය කළ තුර්කි සමාගම ඉල්ලුම්කරු ඉදිරියට මාස 3ක් සේවය කළ යුතු බවත් සේවයෙන් මුදා හැරිය නොහැකි බවත් දන්වා නිකුත් කරන ලද ලිපිය ඒ-11 වශයෙන් මේ අධිකරණයේ සලකුණු කරන ලදී. එම ලිපිය එම රටේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සහතික කොට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට එවා ඇති කොටස ඒ-11 ඒ වශයෙන් සලකුණු කර ඇත. එම ලිපියෙන් ප්‍රකාශ කරන්නේ ඉල්ලුම්කරු 1999.07.31 වැනි දින දක්වා සේවයෙන් මුදා හැරිය නොහැකි බවයි. එම ලිපියම ද ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් සහතික කොට මහවැලි අධිකාරියට එවා ඇත. එම ලිපිය ඒ-12 වශයෙන් ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ලිපිය ඒ-12ඒ වශයෙන් ද සලකුණු කර එවා ඇත. ඉන්පසු ඉල්ලුම්කරු 1999.07.02 වැනි දින ශ්‍රී ලංකාවට පැමිණ නැවත සේවයට වාර්තා කිරීමට ඉඩ ලබාදෙන ලෙස කළමණාකාර අධ්‍යක්ෂ පිරිස් පාලන මගින් 1999.07.05 වැනි දින ලිපියෙන් ඉල්ලීමක් කර ඇත. එම ලිපිය ඒ-13 වශයෙන් මේ සමග අමුණා ඇත. එම ලිපිය ඉල්ලුම්කරුට ඔහු කලින් තනතුර භාර ගන්නා ලෙස 1999.07.05 වැනි දින ලිපියෙන් 1999.07.06 වැනි දින රාජකාරි භාර ගන්නා ලෙස දැනුම් දී ඇත. එම කොටස ඒ-13ඒ වශයෙන් සලකුණු කර ඇත. පසුව ඉල්ලුම්කරු සේවය කරමින් සිටින විට 1999.11.06 වැනි දින පාලන නිලධාරී පී. හේවාවිතාරණ මහතා ඉල්ලුම්කරුට ලිපියක් එවමින් ඉල්ලුම්කරුට නිකුත් කරන ලද සේවය හැර යාමේ ලිපිය ඉල්ලුම්කරු විසින් ඔහුට නොලැබුණු බව සනාථ කළ නොහැකි නම් නැවත සේවයේ පිහිටුවීම අනුමත කළ නොහැකි බව දන්වා ඇති අතර එම ලිපිය ඔහුට නොලැබුණු බව සනාථ කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඒ-14 ලිපියෙන් දන්වා ඇත.

එම ලිපියට පිළිතුරු යවන ඉල්ලුම්කරු ඒ-14 ලිපිය ලැබුණු බවත් සේවය අත්හැර යාමේ ලිපිය ඉල්ලුම්කරුට නොලැබුණු බවත් එය තහවුරු කිරීම සඳහා කුමන ආකාරයක ක්‍රියා පිළිවෙතක් අනුගමනය කළ යුතු හා කිනම් ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු බව ඉල්ලුම්කරුට දන්වන ලෙසත් ඉල්ලුම්කරු වගඋත්තරකාර අධිකාරිය වෙතින් දන්වා ඇත. එම ලිපිය ඒ-15 වශයෙන් මේ සමඟ සලකුණු කර ඇත. ඉල්ලුම්කරු ඒ පිළිබඳව තමා සේවය අතහැර යාමේ ලිපියක් නොලැබුණු බව සහතික කරමින් දිවුරුම් ප්‍රකාශයක් 2000 වසරේ අග 26 වැනි දින ඉදිරිපත් කොට ඇත. එම දිවුරුම් ප්‍රකාශය ඒ-16 වශයෙන් සලකුණු කර ඇත. ඒ-16 දිවුරුම් ප්‍රකාශයේ සත්‍ය සිද්ධිය මා සඳහන් කර ඇත. ඉන් පසු එයට ප්‍රතිචාරයක් නොලැබීම නිසා මා විසින් රැකියාව අහිමි කිරීම පිළිබඳව කම්කරු කොමසාරිස්තුමා වෙත 2004.08.09 වැනි දින සම්පූර්ණ විස්තර සහිතව ලිපියක් යවා ඇති අතර එම ලිපිය මෙම අධිකරණයේ ඒ-17 වශයෙන් සලකුණු කොට ඇත. මා විසින් මහවැලි අධිකාරියේ ගරු අමාත්‍යතුමා වෙත මට සිදු වූ අසාධාරණය පිළිබඳව ලිපියක් යැවූ අතර එම ලිපිය ඒ-18 වශයෙන් සලකුණු කොට ඇත.

මැද කොළඹ කම්කරු කොමසාරිස්වරයා වෙත මා විසින් කරන ලද පැමිණිල්ල පිළිබඳව 2004 සැප්තැම්බර් මස 15 වැනි දින පරීක්ෂණයකට මහවැලි අධිකාරියත්, ඉල්ලුම්කරුවත් කැඳවා තිබුණි. එම ලිපිය ඒ-19 වශයෙන් මේ සමඟ සලකුණු කොට ඇත. ඒ පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වූ මැද කොළඹ සහකාර කම්කරු කොමසාරිස්තුමා 2005.03.15 වැනි දින ලිපියෙන් නැවත ඉල්ලුම්කරුව

සේවයේ පිහිටුවන ලෙස නිර්දේශ කරන බවත් එසේ කිරීමට අපොහොසත් වුවහොත් කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය අනුව මේ ආරවුල බේරුම්කරුවෙකු වෙත යොමු කරනු ලබන බවත් මහවැලි අධිකාරියට දන්වා ඇත. එම ලිපිය ඒ-20 වශයෙන් මෙම අධිකරණයේ සලකුණු කොට ඇත.

ඉන්පසුව මෙම ආරවුල කාර්මික සම්බන්ධතා අංශය වෙත යොමු කොට ඇති අතර, කාර්මික සම්බන්ධතා අංශයේ නියෝජ්‍ය කොමසාරිස් 2005.08.05 වැනි දින ලිපියෙන් 2005.08.24 වැනි දින පරීක්ෂණයක් පවත්වන බවත් එයට මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ට පැමිණෙන ලෙසත් දන්වා ඇත. එම ලිපිය ඒ-21 වශයෙන් මෙම අධිකරණයේ සලකුණු කොට ඇත. ඒ පිළිබඳ පරීක්ෂණයක් පවත්වා කම්කරු කොමසාරිස් ඩී. එම්. එස්. දිසානායක මහතා 2006.06.15 වැනි දින මහවැලි අධිකාරියට ලිපියක් යවමින් ඉල්ලුම්කරු හිතා මතා වරදක් කර නොමැති බැවින් ඔහුට හිඟ වැටුප් සහිතව සේවයේ ස්ථාපිත කර දින 14ක් ඇතුළත ඔහුට වාර්තා කරන ලෙස දන්වා ඇත. එසේ නොකරන්නේ නම් මෙම ආරවුල බේරුම්කරුවෙකු වෙත යොමු කරන බව වගඋත්තරකාර අධිකාරිය වෙත දන්වා ඇත.

මා ඉදිරියේ දී වගඋත්තකාර අධිකාරිය වෙනුවෙන් සාක්ෂි දෙනු ලැබුවේ පියසීලි හේවාවිතාරණය. ඔහුගෙන් හරස් ප්‍රශ්න ඇසීමේ දී ඉල්ලුම්කරු සේවයෙන් මුදා හැර තිබිය දී 1999.02.03 දින ෆැක්ස් පණිවුඩයක් එවූ බව පිළිගනී. තවදුරටත් එම ෆැක්ස් පණිවිඩයෙන් ඉල්ලුම්කරු 1999.03.10 වැනි දින ඔහුගේ අනුමත වැටුප් සහිත නිවාඩු අවසන් වන බවත් ඉල්ලුම්කරු සේවය කරනු ලබන ආයතනයේ අවශ්‍යතාවය මත මාස 03ක කාලයක් සේවය කිරීමට සිදු වී ඇති බවත් ඉල්ලුම්කරු එහි කියා තිබෙනවා ද ? "ඔව්" එය නිවැරදි බව හේවාවිතාරණ මහතා පිළිගනී. 1999.03.10 වැනි දින සිට මාස 03ක කාලයක් සඳහා සේවය දීර්ඝ කරන ලෙස ඉල්ලුම්කරු ඉල්ලා ඇති බව විතාරණ මහතා හරස් ප්‍රශ්නවල දී පිළිගෙන ඇත. ඒ-8 ලිපිය වගඋත්තරකාර ආයතනයට ලැබුණු බව ද විතාරණ මහතා හරස් ප්‍රශ්න ඇසීමේ දී පිළිගෙන ඇත. ඒ-11, ඒ-12 ලේඛන මහවැලි අධිකාරියෙන් ලැබුණු බව විතාරණ මහතා පිළිගෙන ඇත. 2009.09.17 වැනි දින නඩු වාර්තා පිටපතේ 2, 3, 5 යන ඡේදවල එය සඳහන් වේ.

මේ අනුව ඉල්ලුම්කරුට රැකියාවට නියමිත වේලාවට වාර්තා කිරීමට උවමනාව තිබුණ ද ඉල්ලුම්කරු සේවය කළ තුර්කි සමාගම විසින් මාස 3ක කාලයක් සඳහා ඔහු මුදා හැරිය නොහැකි බව ඒ-11 ලිපියෙන් දන්වා ඇත. ඒ-11 ලිපියත් සමග සත්‍ය පිටපතක් බව ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් එය සහතික කොට ඇත. ඒ-11 ලිපියත් සමග ඒ-12 ලිපිය ශ්‍රී ලංකා තානාපති මගින් ලේකම්, මහවැලි සංවර්ධන අමාත්‍යාංශය වෙත එවා ඇත. ඒ-12 ලිපිය ඉල්ලුම්කරු විසින් එවන ලද ලිපියක් බව තානාපති කාර්යාලය සහතික කොට ඇත.

ඉල්ලුම්කරු තමා ශ්‍රී ලංකාවේ දී කළ රැකියාව නැති කර ගැනීමට කිසිදු වුවමනාවක් නොතිබූ බවත් ඔහුගේ ගුවන් ගමන් බලපත්‍රය හා අනෙකුත් සහතික තුර්කි සමාගම විසින් ඉල්ලුම්කරුට ලබා නොදීම නිසා ඉල්ලුම්කරුට කිසි සේත්ම එම රටින් පිට වීමට අවස්ථාවක් නොලැබුණු බව ඉදිරිපත් වූ කරුණු අනුව මට පිළිගැනීමට සිදු වේ. ඉල්ලුම්කරු ශ්‍රී ලංකාවට පැමිණි පසු 1999.07.06 වැනි දින වගඋත්තරකාර අධිකාරිය විසින් ඔහු සේවයේ පිහිටුවා ඇති අතර ඔහුට රාජකාරිය ද භාර දී ඇති බව ඒ-13 ලිපියෙන් පැහැදිලිව ඔප්පු වේ. ඉල්ලුම්කරු එසේ සේවය කරමින් සිටින විට මාස 2කට පසුව ඉල්ලුම්කරුට සේවය අත්හැර යෑමේ ලිපිය නොලැබුණු බව සනාථ කරන ලෙස වගඋත්තකාර අධිකාරිය දන්වා තිබීම සාධාරණ හා යුක්ති සහගත නොවන බව මම නිගමනය කරමි.

වගඋත්තරකරු දිවුරුම් ප්‍රකාශය මගින් ප්‍රකාශ කර ඇත්තේ තමාට එවැනි ලිපියක් නොලැබුණු බවයි. එවැනි ලිපියක් ඉල්ලුම්කරුට ලැබුණු බවට සනාථ කිරීමට වගඋත්තරකාර සමාගම අපොහොසත්ව ඇත. මේ සියලු කාරණා සැලකිල්ලට ගැනීමේ දී ඉල්ලුම්කරු සේවය අත්හැර නොගිය අයෙක් බව මම තීරණය කරමි. එම හේතුව නිසා ඉල්ලුම්කරු අවුරුදු 02යි මස 03 අවසන් වී නැවත ශ්‍රී ලංකාවට පැමිණි පසු ඔහු නැවත සේවයේ පිහිටුවා ඇත්තේ වගඋත්තරකාර පාර්ශවයේ වගකිවයුතු නිලධාරීන් විසිනි.

ඉහත කරුණු අනුව ඉල්ලුම්කරුට ඔහුගේ සේවය නවතා සිටි කාලයට (1999.07.05 දින සිට) හිඟ වැටුප් සහිතව නැවත සේවයේ පිහිටුවන ලෙසට වගඋත්තරකාර පාර්ශවයට නියෝග කරන අතර, එම නියෝගය යුක්තිසහගත හා සාධාරණ බව මම තීරණය කරමි. මෙම ප්‍රදානය රජයේ ගැසට් පත්‍රයේ පළ වී මාස 3ක් ඇතුළත මෙම නියෝගය ක්‍රියාත්මක විය යුතු බවට දැනුම් දෙමි.

නීතිඥ කේ. ඒ. ට්‍රෙවෝ ප්‍රනාන්දු,
බේරුම්කරු.

2012 මැයි මස 14 වැනි දින,

06-1038